ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>සර්දාර් පටේල්තුමාගේ 150 වන ජන්ම සංවත්සරය නිමිත්තෙන් ඡායාරූප ප්‍රදර්ශනයක්</u>**

ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් සන්තෝෂ් ඡා මහතා ඉන්දියාවේ යකඩ මිනිසා ලෙස හැඳින්වෙන සර්දාර් වල්ලභායි පටේල්තුමාගේ 150 වන ජන්ම සංවත්සරය නිමිත්තෙන් එතුමාගේ ජීවිතය සහ උරුමය අනුස්මරණය කරමින් ඡායාරූප ප්‍රදර්ශනයක් අද දින කොළඹ හැරල්ඩ් පීරිස් ගැලරියේදී විවෘත කළේය.

2. බෙදුණු භූමියක් එක්සත් ජාතියක් බවට පරිවර්තනය කරමින් අචල ශක්තියකින් ඉන්දියාව එක්සත් කළ ඉන්දියාවේ එක්සත්භාවයේ නිහඬනිර්මාතෘවරයාගේ ගමන්මඟ, ප්‍රත්‍යාස්ථභාවය සහ කැපවීම මෙම ප්‍රදර්ශනයෙන් පෙන්නුම් කෙරේ. සර්දාර් වල්ලභායි පටේල්තුමා නිදහස් ඉන්දියාවේ ප්‍රථම නියෝජ්‍ය අග්‍රාමාත්‍යතුමා මෙන්ම ස්වදේශ කටයුතු අමාත්‍යතුමා ද විය.

3. ප්‍රදර්ශනය විවෘත කරමින් මහ කොමසාරිස්තුමා සඳහන් කළේ කුමාර රාජ්‍යයන් 500කට අධික සංඛ්‍යාවක් තනි ජාතියක් ලෙස ඒකාබද්ධ කළ නායකයකු ලෙස සර්දාර්තුමාගේ සුවිසල් බලපෑම නූතන ඉන්දියාවට පදනම සකස් කළ බවයි. "අද දින අප එතුමා සිහිකරන අතර එක්සත්භාවය, ශක්තිය සහ දේශප්‍රේමීත්වය පිළිබඳ පටේල්තුමාගේ පරමාදර්ශ අන් කවරදාටත් වඩා වර්තමානයේදී වලංගු වන්නේ බෙදා හදා ගන්නා අරමුණක බලය අපට සිහි ගන්වමිනි. එතුමා හැඩ ගැස්වීමට උපකාරී වූ දේශපාලන මායිම් සඳහා මෙන්ම පරම්පරා ගණනක් අභිප්‍රේරණය කරන ප්‍රත්‍යාස්ථභාවයේ සහ එක්සත්භාවයේ වටිනාකම් සඳහා එතුමා දැක්වූ දායකත්වය අදත් නොනැසී පවතී", යනුවෙන් මහ කොමසාරිස්තුමා සඳහන් කළේය.

4. විද්වතුන්, ඡායාරූප සංගම් සහ පුස්තකාල සංගම්වල නියෝජිතයන් සහ සිසුන් රැසක් ප්‍රදර්ශනය විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වූහ. මෙම ප්‍රදර්ශනය කොළඹ, ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ හැරල්ඩ් පීරිස් ගැලරියේ 2024 ඔක්තෝබර් 30 වන දින ප.ව. 7 දක්වා විවෘතව තැබෙනු ඇත.

***

**කොළඹ**
***2024* ඔක්තෝබර් *29***